(පහත දැක්වෙනුයේ HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ 2017 සංකලිත වාර්ෂික වාර්තාවේ පිටු අංක 28 - 33 හි සඳහන් සභාපතිතුමියගේ විවරණයේ සිංහල පරිවර්තනයක් පමණි.)

**සභාපතිතුමියගේ පණිවිඩය**

අප සමාගමේ 16 වැනි වාර්ෂික මහ සභා රැස්වීමට ඔබ සියළු දෙනා ඉතා සතුටින් පිළිගන්නා අතර 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අපගේ හයවැනි සංකලිත වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සිදුකරන්නේ හද පිරි සතුටිනි. අභියෝගාත්මක සාර්ව ආර්ථික පරිසරයක් සහ අඛණ්ඩ තරඟකාරිත්වයක් සහිත පසුබිමක් තුළ අප සමාගමේ 2016 වසරට සාපේක්ෂව ආදායමේ 17% ක වර්ධනයක්ද ශුද්ධ ලාභයේ ඉතා ආකර්ෂණීය 41% ක වර්ධනයක් ද මෙම ප්‍රකාශිත වර්ෂය තුළ ළඟාකරගෙන තිබෙන බව සඳහන් කරන්නේ ඉතාමත් සොම්නසිනි.

**ගෝලීය සන්දර්භය (**The Global Context)

2017 ගෝලීය ආර්ථික වර්ධනය ඇස්තමේන්තුගත 3.7% ට වඩා වැඩි වර්ධනයක් පෙන්නුම් කරයි . මෙය ලෝක දළ දේශීය නිෂ්පාදිතයට 75% ක පමණ දායකත්වයක් දක්වන රටවල ආර්ථික ක්‍රියාකාරකම් වර්ධනය වීම තුළ ප්‍රධාන වශයෙන්ම සිදුවූවකි. මෙම ප්‍රවණතාව අනුව යමින් 2018 සඳහා ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපීය රටවල් කිහිපයක සහ දියුණු ආසියානු ආර්ථිකයන් හි වර්ධන පුරෝකථනයන් මීට පෙර සිදුකළ පුරෝකථනයන්ට සාපේක්ෂව වැඩි ප්‍රතිශෝධන සහිතව ශක්තිමත් බවක් පෙන්නුම් කරයි. සංවර්ධනය වෙමින් පවතින සහ ඉහළට නැගෙමින් සිටින ආසියාතික රටවල් 2018 වර්ෂයේ 6.5% ක අනුපාතයට සමාන වේගයකින් වර්ධනය වේ යැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත් සංවර්ධිත ආර්ථිකයන් හි දක්නට ලැබූ මූල්‍ය ප්‍රතිපත්ති වල වෙනස්වීම්, අභ්‍යන්තර දැක්ම සහිත ප්‍රතිපත්ති සහ භූ දේශපාලනික අවිනිශ්චිතභාවයන් සහ ලෝකය පුරා ඇතිවූ ආන්තික කාලගුණික තත්ත්වයන් හි හදිසි වෙනස් වීම් සහ වෙනත් සාධක මේ තත්ත්වය ට අහිතකර බලපෑමක් එල්ල කිරීමට හැකියාවක් ඇත.

**ශ්‍රී ලාංකීය ආර්ථිකය (Sri Lankan Economy)**

විශාල ස්වාභාවික ව්‍යසන දෙකකට මුහුණ දුන් මෙරටෙහි දළ දේශීය නිෂ්පාදිතය පසුගිය වසරට සාපේක්ෂව 2017 වසරේදී 4% කට ආසන්න ප්‍රමාණයකින් වර්ධන වේගයක් පෙන්නුම් කෙරේයැයි බලාපොරොත්තුවේ. කාර්මික ක්‍රියාකාරකම් වල වේගවත් ක්‍රියාකාරීත්වය සහ සේවා අංශයේ දැක්වූ වර්ධනයත් මෙයට ප්‍රධාන හේතුව විය. කාලගුණය සම්බන්ධ බාධාවන් නිසා කෘෂිකාර්මික කටයුතු අඛණ්ඩව පසුබෑමකට ලක්විය. වසරේ මුල් මාස නවය තුළ වාර්තාවූ කාර්මික කටයුතුවල 4.5% ක වර්ධනය ඉදිකිරීම් සහ පතල් සහ කැණීම් වැනි කටයුතු වල පුළුල් වීම සහ නිෂ්පාදන ක්‍රියාකාරකම් අඩු වර්ධන වේගයක් දැක්වීම හේතු විය. මූල්‍ය සේවා, ප්‍රවාහනය, සෞඛ්‍යසේවා, සිල්ලර වෙළෙඳාම සහ තොග වෙළෙඳාම් අංශයන් මෙම වසරේ පළමු මාස නවය තුළ එකතු කළ අගය මත සේවා කටයුතු වර්ධනය සඳහා 4.2%ක සමස්ථ වර්ධන දායකත්වයක් දක්වන ලදී.

ජාතික පාරිභෝගික මිල දර්ශකය මගින් මනින මතුපිට උද්ධමනය වසර මැද කාලය සඳහා උඩුකුරු ප්‍රවණතාවක් දැක්විය. බදු සංශෝධන වල බලපෑම, දේශය තුළ පැවති හානිදායක කාලගුණික තත්ත්වය සහ ඉහළ නගින ගෝලීය භාණ්ඩ මිල ගණන් මතුපිට උද්ධමනය ඉහළ මට්ටමක පැවතීමට හේතු විය. 2016 සිට 2017 දක්වා කාලය තුළ ජාතික පාරිභෝගික මිල දර්ශකය 4.0% සිට 7.7% දක්වා වර්ධනය විය. සාමාන්‍ය වාර්ෂික මතුපිට උද්ධමනය ට සමාන තත්ත්වයක් වාර්තා කරමින් 2017 දෙසැම්බර් වන විට කොළඹ පාරිභෝගික මිල දර්ශකය ද ආහාර ද්‍රව්‍යයන්හි මිල උද්ධමනයේ ප්‍රතිපලයක් නිසා 2017 දෙසැම්බර් වන විට 6.6% ක වැඩිවීමක් දැක්වීය. කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි මූලික උද්ධමනය වසර ආරම්භයේදී ඉහළයාමේ ප්‍රවණතාවක් දැක්වූ අතර ඉන්පසු කාලයේ ඒකාකාරී ස්වාභාවයකින් යුක්ත විය. කෙසේ වෙතත් කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි උද්ධමන දර්ශකය 2017 වසර තුළ 4.4% සිට 5.9% දක්වා වාර්ෂික වර්ධනයක් වාර්තා කර ඇත. වර්ෂයේ වාර්තාවූ ඉහළ

උද්ධමනය නිසා ඇතිවූ මුර්ත වැටුප් වල අගය අඩුවීම හේතුවෙන් පාරිභෝගිකයන්ගේ වැය කළ හැකි ආදායම අඩුවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබිණි.

ප්‍රතිපත්තිමය පොලී අනුපාතය මූල අගයයන් 25 කින් වර්ධනය කරමින් මහ බැංකුව තම දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය අඛණ්ඩව 2017 වසරේත් ඉදිරියට ගෙන යන ලදී. මහ බැංකුවේ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරයේ සහ වෙළෙඳපොල ද්‍රවශීල තත්ත්වයේ පීඩනකාරී තත්ත්වයන්හි සංයුක්ත බලපෑම තුළ වෙළෙඳපොල පොලී අනුපාත වසරේ මුල භාගය තුළ ඉහළ යාමකට තුඩු දුනි. කෙසේ වෙතත්, 2017 වසරේ දෙවන භාගයේදී රජයේ ණයගැනීම් අවශ්‍යතා අඩු වීම සහ ආණ්ඩුවේ සුරැකුම්පත් වෙළෙඳපොළෙහි විදේශ ආයෝජන වැඩිවීම තුළ වෙළෙඳපොල පොලී අනුපාතයන් පහත බැසීම නිසා මෙම ප්‍රවණතාව ආපසු හැරීමක් දක්නට ලැබුණි.

2017 වසරේදී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 2.3% කින් අවප්‍රමාණය විය.

පසුගිය වසරේ මේ කාලය සමඟ සන්සන්දනය කිරීමේදී, වසරේ පළමු මාස එකොළහ තුළ ශ්‍රී ලංකාවේ අපනයන ආදායම 9.4% ක වර්ධනයක් වාර්තා කරන ලදී. ගෝලීය වෙළෙඳපොළ තුල වැඩිවුණ භාණ්ඩ මිල සහ ප්‍රධාන අපනයන වෙළෙඳපොල යථා තත්ත්වයට පත්වීම මෙම ධනාත්මක ප්‍රවණතාවට හේතු විය. ආනයන වියදම් වල වැඩිවීමක් තිබුණද, අපනයන ආදායම් වැඩිවීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් ණය පහසුකමෙහි දෙවන (IMF- EFF) සහ තෙවන අදියර විචරණ සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම් හේතුවෙන් වර්ධනය වූ ආයෝජන ලැබීම් තුළින් ගෙවුම් ශේෂයේ පීඩනය යම්තාක් දුරට පහසු තත්ත්වයකට පත්කර ගැනීමට හැකිවිය.

අයවැය පරතරය අවම කර ගැනීමට සහ ඉහළ මට්ටමේ තිබෙන රාජ්‍ය ණය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඉලක්ක කරගෙන රජය තම ආදායම් පාදක රාජ්‍ය මූල්‍ය සංස්ථාපන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. මෙම ක්‍රියාමාර්ග අතර 2018 අප්‍රේල් පළමු දින සිට ක්‍රියාත්මක වන නව දේශීය ආදායම් පනත මෙම දිශාවේ වැදගත් සන්ධිස්ථානයකි. මෙම පනත, ආයතනික ආදායම ස්ථර තුනක් සහිත බදු ව්‍යුහයක් හඳුන්වා දීම තුළින් සහ බදු ව්‍යුහයට තවත් වෙනස්කම් රැසක් හඳුන්වාදීම මගින් බදු පදනම පුළුල් කිරීම වෙත අවධානය යොමු කර තිබේ. සීමිත ආදායම් සම්පත් ප්‍රමාණයක් සහ විශාල රාජ්‍ය අංශයක් සහිතව, රාජ්‍ය ණය පියවීම මෙම වසර තුළ රාජ්‍ය මූල්‍ය කටයුතු වල තිබූ ප්‍රධාන අභියෝගයකි. මෙම සන්දර්භය තුළ එකට එක්වුණ ණය ගෙවීම් ගැටළුවට විසඳුම් සෙවීම සඳහා රාජ්‍ය ණය වඩා හොඳින් කළමනාකරණය කිරීම සඳහා වගකීම් කළමනාකරණ පනත් කෙටුම්පත සකස් කිරීම වැනි මූලාරම්භයන් කිහිපයක් සිදු කරන ලදී. ඊට අමතරව, එහි බලපෑම ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය වගකීම් කළමනාකරණ පනතට සංශෝධන ඉදිරිපත් කිරීමටත් යෝජනා විය.

මෙම ධනාත්මක වර්ධනයන් ද සමඟ, ධනාත්මක බාහිර තත්ත්වයන් සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අපේක්ෂිත වර්ධනයන්ද ඇතුළත්ව, 2018 වසරේදී ආර්ථිකය වඩා යහපත් කාර්යයසාධනයක් දක්වනු ඇතැයි අපේක්ෂා කළ හැකිය. පෞද්ගලික අංශය ආර්ථික වර්ධනයෙහි හා රැකියා උත්පාදනය කරනා ප්‍රධාන සාධකයක් ලෙස පිළිගෙන ඇත. රාජ්‍ය මූල්‍ය කළමනාකාරිත්වය සහ තරඟකාරිත්වය වර්ධනය කිරීමේ අරමුණින් රාජ්‍ය, මධ්‍ය කාලීන ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කිරීමට කැපවී තිබේ. කෙසේ වෙතත්, පවතින සංකීර්ණ දේශපාලනික පරිසරය තුළ මෙම අරමුණු ළඟාකර ගැනීම අභියෝගයක් වනු ඇත.

## රක්ෂණ කර්මාන්තය (The Insurance Industry)

රටේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගයට වඩා වැඩි ආකර්ෂණීය වේගයකින් වර්ධනයක් පෙන්වමින් රක්ෂණ කර්මාන්තය, පසුගිය වසර කිහිපය තුළ ප්‍රශංසනීය වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2016 හා සමග සංසන්දනය කරනවිට 2017 තුල ජීවිත රක්ෂණ කර්මාන්තය තුළදී දළ ලිඛිත පාරිතෝෂික 12% ක වර්ධනයක් වාර්තා කළ අතර සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ දළ ලිඛිත පාරිතෝෂික අනුපාතය 16% කින් වර්ධනය විය. ජීවිත රක්ෂණ කර්මාන්තයේ වර්ධනය මෙම වසර තුළ අඩුවීමක් පෙන්නුම් කෙරිණි. මේ තත්ත්වයට හේතුවූ ප්‍රධාන සාධක අතර අදායම් මූලාශ්‍රිතවලට කාලගුණය ආශ්‍රිත බාධාවන් විය. කෙසේ වෙතත්, සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය තම වර්ධන වේගය තුළ ආන්තික වර්ධනයක් දක්වා තිබේ. මෙයට ප්‍රධාන හේතුව වන්නේ වැඩිකරන ලද පාරිතෝෂික සහ රජය විසින් පාසල් දරුවන්ට හඳුන්වාදුන් වෛද්‍ය රක්ෂණාවණය නිසා සැළකිය යුතු පාරිතෝෂික ආදායමක් කර්මාන්තය තුළට ගලායාමය. රක්ෂණ ක්ෂේත්‍රයේ අවධානය 2017 තුලදී ද අලෙවිය සහ ලාභදායිත්වය වැඩි කිරීම වෙත අඛණ්ඩව යොමු වී පැවතුන අතර එය ඉතා දැඩි තරගකාරී පසුබිමක් තුළ සිදුවිය.

රක්ෂණ සමාගම් මුළු සංඛ්‍යාව 27 ක් වූ අතර සංයුක්ත රක්ෂණ සමාගම් 2 ක්, ජීවිත රක්ෂණ සමාගම් 12 ක් සහ සාමාන්‍ය රක්ෂණ කටයුතු වල යෙදෙන සමාගම් 13 ක් 2017 වසර අවසන් වන විට ක්‍රියාත්මක විය. පසුගිය වසරේ ක්‍රියාත්මක වූ සංයුක්ත රක්ෂණ සමාගම් සංඛ්‍යාව 3 ක් වූ අතර ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ අංශයේ ක්‍රියාත්මක වූ රක්ෂණ සමාගම් සංඛ්‍යාව මෙම වසරේ සංඛ්‍යාවටම සමාන විය. පවතින එක් සාමාන්‍ය රක්ෂණ සමාගමක් තවදුරටත් නව රක්ෂණයන් නොපිළිගන්නා අතර ශ්‍රී ලංකාවෙන් ඉවත්ව යාමේ ක්‍රියාවලියක නිරතව සිටින බව වාර්තා වේ.

අඛණ්ඩව වෙනස්වන නියාමනයන් සහ අනුගත විය යුතු අවශ්‍යතා මෙන්ම වෙනත් ආර්ථික සාධක අනුව යමින් පසුගිය වසර කිහිපය තුළ කර්මාන්තය සැළකිය යුතු පරිවර්තනයක් අත්විඳි අතර එමගින් කර්මාන්තයේ ස්වභාවය වෙනස් වෙමින් පවතී. වෙන්කිරීමේ රෙගුලාසි ක්‍රියාත්මකභාවයට පත්වීම සමග කර්මාන්තයේ අත්පත්කරගැනීම් සහ ඒකාබද්ධ වීම් කිහිපයක් දක්නට ලැබිනි. තවදුරටත් ඒකාබද්ධ වීමේ සංඥා දක්වමින්, විශාල සමාගම් විසින් විශේෂයෙන්ම සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ අත්පත් කරගැනීම් සහ මිලදී ගැනීම් සිදුකිරීම පිලිබඳව 2017 වසර තුළදී ද උනන්දුවක් දක්වනු පෙනුනි.

පසුගිය වසරේ ක්‍රියාත්මක කරන ලද අවදානම පදනම් කරගත් ප්‍රාග්ධන ක්‍රමය (Risk Based Capital) වර්තමාන වසර තුළදී ද එසේම ක්‍රියාත්මක විය. නියාමකයා විසින් සියළුම පාර්ශ්වකරුවන් සඳහා සමානව සැලකීමේ අරමුණ සහිතව ජීවිත රක්ෂණය මත අවදානම් පාදක ප්‍රාග්ධන රීති දැනට සමාලෝචනය කරමින් සිටී. කෙසේ වෙතත් එක් එක් රක්ෂණ සමාගම් තම ව්‍යාපාර කටයුතු වල දරන අවදානම සහ ඒවායේ නිෂ්පාදනයන් එකිනෙකට වෙනස් වන නිසා මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට පෙර එහි ප්‍රතිවිපාක පිළිඹඳව ගැඹුරට අධ්‍යානය කල යුතුය. රක්ෂණ කර්මාන්තයට අදාළව මූල්‍ය වාර්තා කරනය තුළද වෙනස්කම් සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. එවන් එක් විශාල වෙනසක් වන්නේ මූල්‍ය උපකරණ මත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිති 9 (SLFRS 9)යොදාගැනීමයි. නව ප්‍රමිති අවශ්‍යතා පිළිගැනීම 2018 සිට සිදුකළ යුතු අතර එය 2021දක්වා කල් දැමීමේ විකල්පය සහිතය. තවදුරටත් ලෝකය පුරා සිටින රක්ෂකයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 17 (IFRS 17) රක්ෂණ කොන්ත්‍රාත් 2021 සිට අනුගමනය කළ යුතු අතර එමගින් රක්ෂකයන්ගේ මූල්‍ය වාර්තාකරණ මුහුණුවර සැළකිය යුතු වෙනසකට භාජනය කරයි. ඊට අමතරව 2018 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක කිරීමට නියමිත නව බදු පනත යටතේ රක්ෂණ කර්මාන්තයට අදාල බදු ක්ෂේත්‍රය තුළ සැළකිය යුතු වෙනස්කම් හඳුන්වා දී තිබේ. ඒ අනුව ජීවිත රක්ෂණ ව්‍යාපාරය 28% ක බදු වගකීමට යටත්වන අතර සහභාගිත්ව ජීවිත රක්ෂණ දරන ඔප්පු හිමියන් 14% ක බද්දක් ගෙවිය යුතුය. රක්ෂණ ඔප්පු හිමියන් මත පනවා ඇති නව බද්ද කෙටි කාලීනව හෝ ජීවිත රක්ෂණ ඔප්පු ලබා ගන්නා ප්‍රතිශතය වෙත ඍණාත්මක ප්‍රතිඵල ඇති කිරීමේ හැකියාවක් පවතියි. මේ අතර රක්ෂණ සංකල්පයේ හා පුරුද්දේ වැදගත්කම පිළිගනිමින් රජය සැප්තැම්බර් පළමුවැනි දින ජාතික රක්ෂණ දිනය ලෙස ප්‍රකාශයට පත් කර තිබේ.

2000 අංක 23 දරන රක්ෂණ සමාගම් නියාමනය කිරීමේ පනත 2017 අංක 23 දරන රක්ෂණ සමාගම් නියාමනය කිරීමේ (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලදී. එම සංශෝධිත පනත මගින් හඳුන්වාදුන් එක් ප්‍රධාන වෙනස්කමක් වන්නේ රක්ෂකයා අනිවාර්යයෙන්ම කළ යුතු ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතා වලින් ඉවත් කිරීමයි. ඒ අනුව සමාගමේ සම්පූර්ණ පරිපාලිත සමාගමක් වන HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමට අනිවාර්යයෙන් කළ යුතු ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතා වලින් ඉවත් කරන ලෙස මෙම පනත යටතේ අයදුම් කළ හැකිය. මෙම සංශෝධිත පනත යටතේ හඳුන්වා දුන් තව එක් වෙනසක් වන්නේ නියාමකයාගේ නම "ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය" (Insurance Board of Sri Lanka) වෙනුවට "ශ්‍රී ලංකා රක්ෂණ නියාමන අධිකාරිය" (Insurance Regulatory Commission of Sri Lanka) ලෙස වෙනස් කිරීමයි.

**සමාගමේ කාර්යසාධනය (Performance of the Company)**

පසුගිය වර්ෂයට සාපේක්ෂව 41% ක වර්ධනයක් පෙන්නුම් කරමින් HNB ඇෂුවරන්ස් PLC සමූහය මෙම වර්ෂයේදී රු. මි. 910 ක බදු පසු ලාභයක් වාර්තා කරමින් සමාගමේ ලාභදායිත්වය තවදුරටත් වර්ධනය කර ගෙන ඇති බව මම ඉමහත් සතුටින් යුතුව සඳහන් කරමි. සමූහය මෙම විශිෂ්ඨ කාර්යසාධනය අත් කර ගෙන ඇත්තේ ජීවිත සහ සාමාන්‍ය යන රක්ෂණ ව්‍යාපාර අංශ දෙකම ඉතා ඉහළ කාර්යසාධනයක් අත් කර ගැනීමෙන් ඊට දායක වීම නිසාය.

HNB ඇෂුවරන්ස් PLC සමාගමෙහි ජීවිත රක්ෂණ අංශය 2017 වර්ෂයේදී එයට පෙර වර්ෂයට සාපේක්ෂව 12% ක වර්ධනයක් අත්කර ගනිමින් රු. බි. 3.96 ක දළ ලිඛිත වාරිකයක් වාර්තා කර ඇත. මෙම වර්ෂයේදී ජීවිත රක්ෂණ අංශයෙහි ආදායම් වර්ධන අනුපාතය පෙර වර්ෂයේ තිබූ 27% ක අගයට වඩා අඩුවීමට ප්‍රධාන වශයෙන්ම, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන වශයෙන් සමාගමෙහි තිරසාරබව සහ ලාභදායිත්වය වර්ධනය කර ගැනීම උදෙසා වඩා ශක්තිමත් පදනමක් දැමීමේ අරමුණ ඇතිව තනි වාරික ආයෝජන නිෂ්පාදන අඩු කිරීමට ගනු ලැබූ උපායමාර්ගික තීරණය නිසා බව කිව යුතුය. එවැනි තීරණයක් ගෙන තිබියදී පවා සමාගම, රු. මි. 726 ක බදු පසු ලාභයක් වාර්තා කල අතර, එය පසුගිය වර්ෂයේ ලැබූ රු. මි. 600 ට සාපේක්ෂව 21% ක වර්ධනයකි. එමෙන්ම, අපගේ ජීවිත රක්ෂණ අරමුදල 25% ක වර්ධනයක් පෙන්නුම් කරමින් මෙම මූල්‍ය වර්ෂය අවසානයේදී රු. බි. 11.0 ක අගයක් වාර්තා කරන ලදී. විශේෂයෙන්ම රටෙහි ප්‍රදේශ ගණනාවකට බලපෑ ගංවතුර සහ නියඟය වැනි ආපදා තත්ත්වයන් හේතුවෙන් ගනුදෙනුකරුවන්ගේ නිත්‍ය ආදායමට බාධා ඇතිවීම නිසා වාරික අය කර ගැනීමේදී වර්ෂය පුරාම කලින් කලට සමාගම මුහුණ දුන් දුෂ්කර වාතාවරණයන් හමුවේ වුවද සමාගමට මෙවැනි සාර්ථකත්වයක් අත් කර ගැනීමට හැකි වීම ප්‍රශංසනීය කරුණකි.

අපගේ පූර්ණ පරිපාලිත සමාගමක් වන HNBGI සමාගමෙහි කාර්යසාධනය ද මෙම වර්ෂය තුළදී තවදුරටත් වර්ධනය වූ අතර මෙම වර්ෂයේ සමූහයට ඉතා ඉහළ කාර්යසාධනයක් අත් කර ගැනීම සඳහා එය ප්‍රබල දායකත්වයක් සපයා ඇත. 2017 වර්ෂයේදී, HNBGI සමාගමෙහි දළ ලිඛිත වාරිකය, 24% කින් වර්ධනයක් පෙන්වමින් රු. බි. 3.91 ක් වාර්තා කරන ලදී. මිලකරණයෙහි කිසිදු වෙනස් කිරීමක් හඳුන්වා නොදෙමින් මෙවැනි වර්ධනයක් අත් කර ගැනීම ප්‍රධාන වශයෙන්ම මෙම වර්ෂයේදී ලියන ලද ඔප්පු සංඛ්‍යාව 2016 වර්ෂයට වඩා 11% ක ප්‍රමාණයකින් වැඩිවීම හේතුවෙන් වන අතර එමගින් හිමිකම් සේවාවෙහි ඇති වැඩිදියුණුව සහ අපගේ සන්නාම නාමය කෙරෙහි ගනුදෙනුකරුවන් තබා ඇති විශ්වාසය පිළිබිඹු කෙරෙයි. මේ හේතුවෙන් එම පරිපාලිත සමාගමෙහි ලාභදායිත්වය 2016 වර්ෂයේදී අත් කර ගෙන තිබූ රු. මි. 47 ට සාපේක්ෂව 289% ක විශිෂ්ඨ වර්ධනයක් අත් කර ගනිමින් මෙම වර්ෂයේදී රු. මි. 184 ක් දක්වා තව දුරටත් වර්ධනය විය. රට තුළ ප්‍රදේශ කිහිපයක ගංවතුර සහ සුළි කුණාටුවක් වැනි ආපදා පැවතීම

හේතුවෙන් හිමිකම්පෑමේ වැඩිවීමක් සිදුවීම සහ අලුතින් වාහන ලියාපදිංචි කිරීම් අඩුවීම වැනි තත්ත්වයන් හමුවේ මෙම පරිපාලිත සමාගම ලද කාර්යසාධන වර්ධනය ද ඉතා ප්‍රශංසනීය වේ.

සමූහය, 2016 වර්ෂයේදී ලබා ගත් රු. බි. 1.1 ක ආයෝජන ආදායමට සාපේක්ෂව මෙම වර්ෂයේදී රු. බි. 1.7 ක ආයෝජන ආදායමක් වාර්තා කර ගනිමින් එහි 52 % ක කැපීපෙනෙන වර්ධනයක් අත් කර ගෙන ඇත. එමෙන්ම, මෙම මූල්‍ය වර්ෂය අවසන් වන විට කළමනාකරණය යටතේ ඇති අරමුදල් රු. බි. 15 සීමාව ද ඉක්මවා යන ලදී. මෙම සාර්ථකත්වය අත්කර ගැනීමට හැකිවූයේ සාර්ව ආර්ථික විචලනයන් මගින් නිර්මාණය වූ තත්ත්වයන්ගෙන් නිසි ප්‍රයෝජන ලැබීම සඳහා සකස් කර ක්‍රියාත්මක කරන ලද කාර්යක්ෂම ආයෝජන කළමනාකරණ ක්‍රමෝපායයන් හේතුවෙනි.

විශේෂයෙන්ම පසු ගිය වසර දෙකක කාලය තුළ අප විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රමෝපායයන් මත පදනම්ව සමූහය අත්කර ගෙන ඇති මූල්‍ය කාර්යසාධනය අනාගත අභියෝග ජය ගැනීම සඳහා සහ තවදුරටත් උපායමාර්ගික වර්ධනයක් අත් කර ගැනීම සඳහා අවශ්‍ය ශක්තිමත් පදනමක් නිර්මාණය කර ඇති බව මම ඉතාමත් සතුටින් සඳහන් කරමි.

### ආයතනික පාලනය (Corporate Governance)

තිරසර වර්ධනය දිරිමත් කෙරෙන්නා වූ නියාමන මෙන්ම ස්වේච්ඡා යන දෙයාකාරයේම පාලන පරිචයන් අනුගත කර ගැනීමට HNB ඇෂුවරන්ස් PLC කැපවී සිටියි. ආයතනික පාලන පරිචයන්හිදී සහ නියාමන අවශ්‍යතාවයන් පිළිපැදීමෙහිදී විනිවිදභාවය පිළිබඳව HNBA සමූහයේ අපි, දැඩි ලෙස විශ්වාස කරන්නෙමු. සමාලෝචිත වර්ෂය තුළදී අපි අදාළ සියලුම නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කර ඇති බව සතුටින් සඳහන් කර සිටින්නෙමු. නිසි අවදානම් තක්සේරු සහ කළමනාකරණ උපායමාර්ග අනුගමනය කරමින්, නියාමන අවශ්‍යතාවයන්ට අනුව තිබිය යුතු ප්‍රාග්ධන ප්‍රමාණවත්වීම් අනුපාතයටත් වඩා ඉහළ අනුපාතයක් වර්ෂය පුරාම පවත්වා ගනිමින් සමූහය අවදානම් පාදක ප්‍රාග්ධන ක්‍රමයට සාර්ථක ලෙස නොකඩවා අනුගත වී ඇත.

ක්‍රියාත්මක කරන ලද පාලන පරිචයන් පිළිබඳ පරිපූර්ණ වර්තාවක් අප මෙම වාර්ෂික වාර්තාවෙහි ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහ පරිචයන් සංග්‍රය 2017 දෙසැම්බර් මාසයේදී සංශෝධනය කරන ලදී. හැකි සෑම අවස්ථාවකදීම සමාගමේ ආයතනික පාලන පරිචයන් මෙම සංශෝධිත නව සංග්‍රහයට අනුකූල වන පරිදි සකස් කර ගැනීමට සමාගම විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

### ලාභාංශ ගෙවීම (Dividend Payments)

සමාගමෙහි කාර්යසාධනය වර්ධනය වීමට සමගාමීව, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් කොටසකට රු. 6.00 බැගින් වූ අතුරු ලාභාංශයක් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. මෙය පෙර වර්ෂයට සාපේක්ෂව 20% ක වර්ධනයකි. ඒ අනුව, 2017 වර්ෂය සඳහා කොටසකට ඉපැයීම් රු. 18.20 ක් විය.

### ප්‍රජාව සමග සම්බන්ධවී කටයුතු කිරීම (Engaging with Communities)

ප්‍රජාව සමග එක්ව කටයුතු කිරීම හරහා සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය ගොඩනැගීමේ අරමුණ ඇතිව අධ්‍යාපනය, සෞඛ්‍ය රැකවරණය, කාර්යක්ෂම ජල කළමනාකරණය, කාන්තාවන් සවිබල ගැන්වීම, පරිසරය, සහ කලාව සහ සංස්කෘතිකය යන අංශවලට විහිදුණු ඵලදායී ආයතනික සමාජ වගකීමේ ක්‍රියාකාරකම් ගණනාවක් හරහා සමාජ සංවර්ධනය ඇති කිරීම පිණිස වසර පුරා අපගේ දායකත්ව සපයා

දෙන ලදී. මේ අනුව, සම්මාන දිනූ අපගේ කාර්යක්ෂම ජල කළමනාකරණ වැඩසටහන හරහා අඛණ්ඩව මෙරට ග්‍රාමීය ප්‍රදේශවල පිහිටි පාසල් ගණනාවකට පිරිසිදු පානීය ජල පහසුකම් සපයා දෙන ලදී. එමෙන්ම, අප සමූහය විසින් ක්‍රියාත්මක කරන ලද සෞඛ්‍යාරක්ෂණ ප්‍රජා වැඩසටහන් යටතේ පවත්වනු ලැබූ 'සුවැති දිවියට මගක්' නැමති වැඩසටහන හරහා කාලීන සෞඛ්‍ය ගැටළු පිළිබඳව පොදු ජනතාවගේ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීමේ අරමුණු ඇතිව ශ්‍රී ලංකා ප්‍රජා වෛද්‍යවරුන්ගේ සංගමය සමග හවුල්වී සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම සඳහා අනුග්‍රාහකත්වය සපයා දෙමින් සෞඛ්‍යාරක්ෂාව සම්බන්ධයෙන් දැනුම්වත්භාවය ඇතිකිරීමේ හා දැනුම බෙදාදීමේ ක්‍රියාවලියට දායකත්වය සපයා දෙන ලදී. සම්පත් සපයාදීම පිළිබඳ සළකා බැලීමේදී, අප සමූහය විසින් මීගමුව දිස්ත්‍රික් මහ රෝහලට සහ රිජ්වේ ආර්යා රෝහලේ ළමා දැඩි සත්කාර ඒකකයට සම්පත් අනුග්‍රහය ලබා දීම විශේෂයෙන් සඳහන් කළ යුතුය. මෙම වර්ෂය තුළදී අඛණ්ඩව 12 වැනි වතාවටත් වාර්ෂික ලේ දන්දීමේ වැඩසටහන පැවැත්වීමට හැකිවීම අපට සතුට සහ ගෞරවයක් ගෙන දෙන්නකි. අපගේ ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරම් පිළිබඳ විස්තරාත්මක ඉදිරිපත්කිරීමක් සංකලිත වාර්ෂික වාර්තාවේ කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය යටතේ අංක 172 සිට 176 දක්වා වන පිටුවල ඉදිරිපත් කර ඇත.

**සම්මාන ලැබීම් (Accolades)**

අප සමූහයේ ශක්තිමත් පැවැත්ම සහ අපගේ ව්‍යාපාරයෙහි සහ තිරසර සංවර්ධ ඉලක්ක හා සමගාමීවූ අපගේ මෙහෙයුම් ක්‍රියාකාරම්වල සාර්ථකත්වය ප්‍රදර්ශනය කරමින් සමාලෝචිත වර්ෂය තුළ අපි විවිධ තිළිණ සහ ගෞරව සම්මාන ගණනාවක් දිනා ගත්තෙමු. HNBA සමාගම විසින් 'අපගේ පාර්ශවකරුවන් ප්‍රීතිමත් කිරීමේ වසර 15 ක්' (15 Years of Delighting Our Stakeholders) නැමති තේමාව යටතේ පළකරන ලද 2016 වර්ෂයේ සංකලිත වාර්ෂික වාර්තාවට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද 53 වැනි වාර්ෂික වාර්තා තිළිණ ප්‍රදානෝත්සවයේදී රක්ෂණ සමාගම් කාණ්ඩයේ රන් සම්මානය හිමි විය. එමෙන්ම ශ්‍රී ලංකා Fintelekt රක්ෂණ තිළිණ 2017 තිළිණ ප්‍රදානෝත්සවයේදී "ක්ෂුද්‍ර රක්ෂණ පෙර ගමන්කරු - ජීවිත රක්ෂණ තිළිණය 2017" කාණ්ඩයෙහි ජයග්‍රාහකයා ලෙස HNB ඇෂුවරන්ස් PLC සමාගම තෝරා ගන්නා ලදී. ඉන්දියාව, පකිස්ථානය, මාලදිවයින සහ බංග්ලාදේශය යන රටවලින් බොහෝ සමාගම් නම් කරනු ලැබ තිබියදී HNBGI සමාගමෙහි ඉස්ලාම් රක්ෂණ අංශයට දකුණු ආසියා ඉස්ලාම් මූල්‍ය සංසදයෙහිදී 'Takaful Window/Unit of the Year' රන් තිළිණය පිරිනමනු ලැබීය. ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය විසින් සංවිධානය කරන ලද ජාතික අලෙවි සම්මේලනයෙහිදී ජීවිත රක්ෂණ අලෙවි විධායක සහ අලෙවි අධීක්ෂක කාණ්ඩය සඳහා වන රිදී සම්මානය HNB ඇෂුවරන්ස් PLC (HNBA) සමාගමේ නියෝජිත කේ.එම්. දුලිෂ් මහතා දිනා ගත්තේය. මේ අතර, ස්වාධීන විගණනයකින් අනතුරුව HNB ඇෂුවරන්ස් PLC සමාගමෙහි ජීවිත රක්ෂණ හිමිකම්පෑම් අංශයෙහි සේවා ප්‍රමිතිය සඳහා ISO 9001 : 2015 අනුකූලතා ප්‍රමිති සහතිකය ලබා ගන්නා ලදී.

**ඉදිරි දර්ශනය (Future Outlook)**

පසුගිය වසර 16 ක කාලය පුරා, HNB ඇෂුවරන්ස් PLC සමාගම නිරන්තරයෙන් වෙනස්වීමට භාජනය වන වෙළඳපොළ ගතිකයන්ට සාර්ථකව හැඩගැසෙමින් අඛණ්ඩව තිරසර වර්ධනයක් පෙන්නුම් කර ඇත. ජීවිත රක්ෂණ කර්මාන්තයේ හයවැනි විශාලතමයා ලෙස අපගේ ස්ථානය නොකඩවා පවත්වාගෙන යන අතරම, අපගේ කාලෝචිත සහ නම්‍යශීලී ක්‍රමෝපායික පරිශ්‍රමයන් මගින් සියලුම පාර්ශවකරුවන් සඳහා වටිනාකම ප්‍රතිලාභ ලබා දීම පිණිස සමාගමේ දළ අලෙවිය සහ ශුද්ධ ආදායම යන දෙකෙහිම වර්ධනයක් අත් කර ගනිමින් ක්ෂේත්‍රයේ ශක්තිමත් පුරුකක් ලෙස සමූහය පෙනී සිට ඇත. දීර්ඝකාලීන ස්ථාවරත්වය

සහ වර්ධනය පවත්වාගෙන යාම පිණිස ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් තුළ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවයන්ට හා පහසුවට සමගාමීව, ඉදිරියේදී අඛණ්ඩව අපගේ නිෂ්පාදන කළඹ සමාලෝචනය කර වැඩිදියුණු කිරීමට අපි කටයුතු කරන්නෙමු. වැඩි දියුණු කළ කාර්යක්ෂමතාවය සහ පහසුව සැලසීම සමගින් සමාගමේ සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින ව්‍යාපාර කටයුතුවලට අවකාශ සලසා දීම පිණිස අපගේ ගනුදෙනුකරුවන්ට සේවා සපයාදීමේදී අපගේ තාක්ෂණික හැකියාවන් තවදුරටත් ශක්තිමත් කිරීමට අපි කටයුතු කිරීමට බලාපොරොත්තුවෙමු. තිරසර වර්ධනය සහ ලාභදායීත්වය සහතික කිරීම පිණිස දුර දක්නා සහ වෙළඳපොළ සංවේදී උපායමාර්ග අඛණ්ඩව අනුගමනය කරමින්, අපගේ මව් සමාගම වන හැටන් නැෂනල් බැංකුවේ සන්නාම ශක්තිය තව දුරටත් ප්‍රයෝජන ගැනීමටඅපි නිරන්තරව කටයුතු කරන්නෙමු.

### නව පත්කිරීම් (New Appointments)

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයට සිදු කරන ලද නව පත්වීම් තුනක් පිළිබඳව මම මෙහිදී සඳහන් කිරීමට කැමැත්තෙමි. දීප්ති ලොකුආරච්චි මහතා 2017 මැයි මස 26 වැනි දින කළමනාකරණ අධ්‍යක්ෂ (ස්වාධීන නොවන සහ විධායක අධ්‍යක්ෂ) ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට පත් විය. එමෙන්ම රජීව් දිසානායක මහතා 2017 ජූනි මස 27 වැනි දින ස්වාධීන නොවන සහ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙසත්, රවි අබේසූරිය මහතා 2018 ජනවාරි මස 01 වැනි දින ස්වාධීන සහ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙසත් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූහ.

### ඉල්ලා අස්වීම් (Resignations)

මෙම වර්ෂය තුළදී අපගේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු සිය තනතුරුවලින් ඉවත් වූහ. එන්.එච්.ටී.අයි. පෙරේරා මහතා, ස්වාධීන නොවන සහ විධායක නොවන අධ්‍යක්ෂ, 2017 අප්‍රේල් මස 27 වැනි දින සිය තනතුරෙන් ඉල්ලා අස්වූ අතර, කේ. බාලසුන්දරම් මහතා, ස්වාධීන සහ විධායක නොවන අධ්‍යක්ෂ, 2017 දෙසැම්බර් මස 22 වැනි දින සේවයෙන් විශ්‍රාම ගත්තේය. අප සමූහයේ දියුණුව උදෙසා එම මහත්වරුන්ගෙන් ලැබුණු අගනා දායකත්වයට මාගේ හෘදයංගම ස්තුතිය පිරිනමමි.

### ඇගයීම (Appreciaton)

අප වෙත ලබා දුන් අගනා සහාය වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසමේ සභාපතිතුමියට, අධ්‍යක්ෂ ජනරාල්තුමියට හා අනෙකුත් සියලුම නිලධාරීන්ටත් අප සමූහය වෙනුවෙන් මාගේ අවංක ස්තුතිය පුද කරමි. එමෙන්ම රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා විසින් 2017 වර්ෂය තුළදී අප වෙත ලබාදුන් අගනා සහයෝගය සහ මෙම කර්මාන්තය උදෙසා ඒ මහතාගේ ඇති කැපවීම සතුටින් සටහන් කරමි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ මාගේ සහෝදර සාමාජිකයින් සියලු දෙනා විසින් මා වෙත නිරතුරුව ලබා දුන් වටිනා මගපෙන්වීම සහ සහයෝගය නොතිබෙන්නට මා හට මෙම සමූහය සාර්ථකත්වය කරා මෙහෙයවීමට නොහැකිවන්නට තිබූ බව මම විශ්වාස කරමි. මා වෙත නිරතුරුව තම සහයෝගය සහ වටිනා දායකත්වය ලබා දෙමින් මෙම අභියෝගාත්මක වර්ෂය පුරා මා සමග සිටීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජික මහත්ම මහත්මීන්ට මාගේ අවංක ස්තුතිය පුද කරමි. එමෙන්ම, අපගේ කළමනාකරණ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී දීප්ති ලොකුආරච්චි මහතාත්, විධායක කමිටු සාමාජික මහත්ම මහත්මීන් ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සියලුම සාමාජික මහත්ම මහත්මීනුත් අප සමූහයේ සාර්ථකත්වය වෙනුවෙන් ඉටු කළ භාරදූර කාර්යභාරය සහ නිරන්තර කැපවීම මාගේ දැඩි අගය කිරීමට ලක් කරමි. තවද, HNBA සමාගමේ සහ HNBGI සමාමේ සියලු කාර්ය මණ්ඩල සාමාජිකයින්

ඔවුන්ගේ සෘජු සේවාව, ආචාර ධර්ම සහ සේවයට ඇති දැඩි කැපවීම හරහා සමූහයේ දියුණුව උදෙසා අගනා දායකත්වය සපයා දෙන ලද බව මා නිරතුරුව අවබෝධයෙන් සිටි අතර මම ඒ සියලු දෙනාටම මාගේ අවංක ස්තුතිය පිරිනමන අතරම ඔවුන්ගේ කැපවීම මාගේ දැඩි අගය කිරීමට ලක් කරමි. එමෙන්ම, අපගේ ශක්තීන් පිළිබඳව තබන ලද විශ්වාසය වෙනුවෙන් අපගේ කොටස්හිමියන්ටත්, ව්‍යාපාර හවුල්කරුවන්ටත්, අපගේ සියලු ගනුදෙනුකරුවන්ටත් මාගේ ස්තුතිය මෙයින් පිරිනමමි. ඔබ අප කෙරෙහි තබා ඇති විශ්වාසයට අපි නිරතුරුව ගෞරව කරමින් ආයතනික පාලන ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම හරහා ආයතනික සංලේඛයක් ලෙස අපගේ පරිපූර්ණත්වය ඔප්නංවමින් අභියෝග හමුවේ අපගේ වර්ධන ගමන් මගෙහි නොසැලී ස්ථාවරව ඉදිරියටම ගමන් කරන බව සඳහන් කරමි.

රෝස් කුරේ,
සභාපතිතුමිය

2018 පෙබරවාරි 09

*(පහත දැක්වෙනුයේ HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ 2017 සංක්ෂිප්ත වාර්ෂික වාර්තාවේ පිටු අංක 34 - 37 හි සඳහන් ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ විවරණයේ සිංහල පරිවර්තනයක් පමණි.)*

# ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

2017 වර්ෂයේ විශේෂ අවස්ථා ආවර්ජනය කිරීම හා HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ (HNBA) හි හයවැනි සංකලිත වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ලැබීම මාහට ඉමහත් සතුටකි. මෙම වාර්ෂික වාර්තාව තුළ අප සමාගමේ සහ එහි පූර්ණ පරිපාලිත සමාගමක් වන HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ (HNBGI) හි තෙවැදෑරුම් කාර්ය සාධනය අන්තර්ගතව ඇත.

අභියෝගාත්මක සාර්ව ආර්ථික පරිසරයක් සහ කර්මාන්තයේ ක්‍රියාකාරීන්ගෙන් එල්ලවන දැඩි තරගකාරීබව තුළ වුවද 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු. මිලියන 910 ක ලාභදායි බදු පසු ලාභයක් HNB ඇෂුවරන්ස් පොදු සමාගම (HNBA) සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම (HNBGI) අත්පත්කරගැනීමට සමත් වී ඇත. මෙහිදී සඳහන් කළයුතු කරුණක් වන්නේ පෙර වර්ෂය හා සැසඳීමේදී බදු පසු ලාභයේ 41% ක වර්ධනයයි. මෙම ලාභදයිත්වයේ සිත්ගන්නාසුළු වර්ධනයට හේතුපාදක වූයේ මැනවින් සිතාබලා ක්‍රියාත්මකකරන ලද උපායමාර්ගයි. අප සමූහයේ සාරධර්ම වලට අනුකූලව ක්‍රියාත්මක කළ ව්‍යාපාරයේ උපායමාර්ගයන් සමාගමේ ස්ථාවර වර්ධනයට මග පෑදූ ජයග්‍රහී සංයෝගය විය.

## අභියෝගාත්මක ව්‍යාපාර පරිසරය (Challenging Business Environment)

2017 වසරේ පළමු භාගය තුළ රටේ දළ දේශීය නිෂ්පාදනය 4% සුළු වර්ධනයක් පෙන්නුම් කළද 2016 අනුරූප කාල සීමා වේ 3.7%ත් සමඟ සැසඳීමේදී ආර්ථික වර්ධනය සාපේක්ෂ වශයෙන් මන්දගාමී විය. උද්ධමන අනුපාතය සමඟ සන්සන්දනය කිරීමේදී 2017 වර්ෂයේ ආර්ථිකයේ නාමික වැටුප් වර්ධනය මන්දගාමී වීමක් දක්නට ලැබුණු අතර මෙය වසරේ සමස්ථ මූර්ත වැටුප් පහත බැසීමට මග පාදන ලදී. මෙම වාතාවරණය හේතුවෙන් වැය කළ හැකි ඒක පුද්ගල ආදායම යම් පසුබෑමක් දැක්වූ අතර එය ජනතාවගේ ක්‍රය ශක්තියට බලපෑමක් සිදු කිරීම තුළ ජීවිත රක්ෂණ කර්මාන්තයට විශේෂ බලපෑමක් එල්ල විය. රජය විසින් පනවන ලද සීමාවන් වල ප්‍රතිඵලයක් වශයෙන් ණය වර්ධනය අඩු වීම කල්බදු අංශයේ පසුබෑමක් පෙන්නුම්කෙරිණි. මෙම තත්ත්වයන් යටතේ රක්ෂණ ක්ෂේත්‍රය තුළ ජීවිත රක්ෂණ අංශයේ අඩු වර්ධනයක් සහ සාමාන්‍ය රක්ෂණ අංශයේ සීමිත වර්ධනයක් පවතී. 2017 වසරේ මැයි මස අත්විඳින ලද දැඩි ගං වතුර තත්ත්වය සාමාන්‍ය රක්ෂණ අංශයට දැඩි බලපෑමක් එල්ලකරන ලදී. මේ හේතුවෙන් ගනුදෙනුකරුවන් වෙත විශාල රක්ෂණ වන්දි හිමිකම් ගෙවීමට සිදුවූ අතර මෙම අරමුදල් ආයෝජනය සඳහා වූ අවස්ථාවන් මගහැරීම සාමාන්‍ය රක්ෂණ අංශයේ ලාභදායිත්වය අඩුකිරීමට තුඩුදුනි.

තවදුරටත් 2016 සහ 2017 වසර තුළ සිදුවූ නියාමනයේ වෙනස්කම් නිසා ද රක්ෂණ කර්මාන්තය ට සැළකිය යුතු අභියෝග රාශියකට මුහුණ දීමට සිදුවිය. නුබුන් වත්කම් ක්‍රමයේ (Solvency Regime) සිට අවදානම පදනම් කරගත් ප්‍රාග්ධන ක්‍රමයට (Risk Based Capital) ප්‍රවේශවීම තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (Insurance Regulatory Commission of Sri Lanka) ක්‍රියාත්මක කරන ලද නව නිර්ණායක යටතේ රක්ෂණ සමාගම් තවමත් නව වෙනස්කම් වලට පූර්ණ ලෙස ලක්වීම සඳහා සූදානම් විය යුතුය. එමෙන්ම රක්ෂණ කර්මාන්තයට අමතර අභියෝගයක් එල්ලකරමින් 2020/2021 වර්ෂයන් වනවිට ක්‍රියාත්මක කිරීමට යෝජිත ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 17 (IFRS 17) හා අනුකූලවීම වෙනුවෙන් අමතර උත්සාහයක් සහ සම්පත් නැවත යෙදවීමක් අත්‍යවශ්‍ය වනු ඇත.

## උපායමාර්ග හා සාරධර්ම (Strategy and Core values)

තිරසාර ව්‍යාපාර වර්ධනයක් ළඟාකර ගැනීම සඳහා ක්‍රමෝපායන් අනුගමනය කිරීමේදී අවදානම් පාදක කරගත් සාර්ව ආර්ථික තත්ත්වයන් සම්බන්ධයෙන් සැළකිල්ල යොමු කරමින් අප සමාගම අඛණ්ඩව තම ව්‍යාපාර විචක්ෂණභාවය සහ අත්දැකීම් තුළින් ලාභදායක අංශයන් හඳුනාගනී. මෙම තත්කාළීන තොරතුරු මගින් මෙහෙයවෙන උපායමාර්ග සමඟ එක් වූ ක්‍රියාකාරකම් දැඩිව අධීක්ෂණය කිරීම තුළින් සමාගම නිවැරදි දිශාවට යොමුකර ඇති අතර සියළුම පාර්ශ්වකරුවන්ට එමගින් වටිනාකමක් නිර්මාණය කිරීමටත් ශක්තිමත් වූ අඛණ්ඩ ලාභාදායිත්වයක් පවත්වාගෙන යාමටත් හැකිවී තිබේ. තවද ශක්තිමත් ආයතනික යහපාලන ක්‍රමවේදයන් වෙළෙඳපොලහිද සේවකයන්ගේද කොටස්හිමියන්ගේද විශ්වාසය අප වෙත ලබාගැනීමට හේතු වී තිබේ. මෙවැනි සියළු පාර්ශ්වකරුවන් සමාගමේ වර්ධනය සහ මූල්‍ය යහපත වෙනුවෙන් සිදුකර ඇති දායකත්වය හට මම ඒ සියළු දෙනාට කෘතඥතාව පළ කරමි.

## කාර්ය සාධනය (Performance)

සමාලෝචිත වසර තුළ HNB ඇෂුවරන්ස් පොදු සමාගම සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම වෙළෙඳපොල වර්ධන වේගයට වඩා ඉහළ අනුපාතයක් වාර්තා කරමින් ඒකාබද්ධ දළ ලේඛනගත වාරිකය ලෙස (Consolidated GWP) රුපියල් බිලියන 7.8 ක් වාර්තා කර ඇත.

## ජීවිත රක්ෂණ (Life Insurace)

ආර්ථිකයේ සහ කර්මාන්තයේ විවිධ අභියෝගද පසුකරමින් සමාලෝචිත වර්ෂය තුළ ජීවිත රක්ෂණ ව්‍යාපාරය විශිෂ්ට වර්ධනයක් දක්වා තිබේ. HNB ඇෂුවරන්ස් පොදු සමාගම රක්ෂණ කර්මාන්තයේ වර්ධන වේගය හා සමගාමීව 12% ක වර්ධනයක් පෙන්වමින් දළ ලේඛනගත වාරිකය ලෙස රුපියල් බිලියන 3.96 ක් අත්පත්කරගෙන ඇති අතර එමගින් HNB ඇෂුවරන්ස් පොදු සමාගම තවදුරටත් වෙළෙඳපොළෙහි හයවැනි ස්ථානය තුළ රඳවාගැනීමට හැකි වී ඇත.

මෙම වර්ෂයේ අප විසින් මෙතෙක් ලබා ගත් වැඩිම ශුද්ධ ලාභය වන රු. මිලියන 726 වාර්තා කළ අතර එය පසුගිය වසරේ ශුද්ධ ලාභය වූ රු. මිලියන 600ට සාපේක්ෂව 21% ක වර්ධනයකි.ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ අතිරික්තය කොටස්හිමියන් වෙත මාරුකිරීම් (Surplus transfer) 2016 වසරේ වාර්තා වූ රු. මිලියන 461 ට සාපේක්ෂව 11% ක වර්ධනයක් වාර්තා කරමින් රු මිලියන 519 දක්වා ඉහළ ගියේය. වසර අවසානය වන විට ජීවිත අරමුදල (Life Fund) රු. බිලියන 10.8 කට ළඟා වූ අතර රක්ෂණ ඔප්පු හිමියන්ට ඉහළම ප්‍රසාද දීමනාව ලෙස රු. 1,000 කට රු. 54 ක් ද අරමුදල් පදනම් වූ ප්‍රතිලාභ (Fund based) රක්ෂණ ඔප්පු හිමියන්ට 8% ක ලාභාංශ අනුපාතයක්ද ලබා දීමට හැකිවිය.

HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ පරිත්‍යාග රක්ෂණ ඔප්පු (Endowment Policies) පසුගිය වර්ෂයට සාපේක්ෂව 17% කින් වර්ධනය වූ අතර සමස්ථ දළ ලේඛනගත වාරිකයට 91% ක දායකත්වයක් ලබා දී ඇත. අනෙකුත් රක්ෂණ සැලසුම් අභිබවා මයිෆන්ඩ් (My Fund) සහ රන්මග (Ranmaga) රක්ෂණ සැලසුම් පිළිවෙලින් 20% ක සහ 38% ක වර්ධනයක් සමගින් කැපිපෙනෙන දායකත්වයක් ලබා දී ඇත.

## සාමාන්‍ය රක්ෂණය (General Insurance)

සාමාන්‍ය රක්ෂණ අංශය බෙහෙවින් විචලනයන්ට හා අවධානමට වැඩිවශයෙන් නැඹුරුය. වසර තුළ කාලගුණික ආපදා නිසා මෙම අංශය විශේෂිත පසුබෑම් අත්විදීය. මේ සියල්ල හමුවේ වුවද අප සමාගමේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය අඛණ්ඩව වර්ධනය විය. වෙළෙඳපොල බාධාවන්ට මුහුණදීමේ අපේක්ෂාවෙන් සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග නිසා සමාගමට ප්‍රශංසනීය හැකි වර්ධනයක් පවත්වාගෙන යාමට හැකිවිය.

සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ ගතිකත්වයට සහ අභියෝග වලට මුහුණ දීම සඳහා පැහැදිළි සහ ඉලක්කගත උපායමාර්ග මගින් මෙහෙයවනු ලැබීමෙන් සහ සමාගමේ සමස්ථ සූදානම හේතුවෙන් HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම 24% ක වර්ධනයක් වාර්තා කරමින් වසර අවසාන වන විට රු. බිලියන 3.91 ක දළ දළ ලේඛනගත වාරිකයක් සහ රු. මිලියන 184 ක ලාභයක් ළඟාකරගෙන තිබේ. 2016 වසරේ දී අනුගමනය කළ අවදානම තෝරාගැනීම, මිලකරණය සහ වියදම් කළමනාකරණය අන්තර්ගත තිරසාර ව්‍යාපාර ආකෘතිය තවදුරටත් පවත්වාගෙනයාම 2017 වසරේ ඒකාබද්ධ අදායම සහ ලාභයේ වර්ධන ප්‍රවනතාව වැඩිදියුණු කිරීමට හේතුවිය.

වසර තුළ වාර්තා කළ වර්ධන වේගය සමාගමේ අනාගත වර්ධනය වේගවත් කරන අතර, ඒ සඳහා සමාගමේ සේවකයන් සහ කළමනාකරුවන්ගෙන් ලද කර්මාන්තයේ නව මිනුම්දඬු ඇතිකරනසුළු විශිෂ්ඨ කාර්යසාධනය උපකාරීවිය.

## ආයෝජන (Investments)

අභියෝගාත්මක සාර්ව ආර්ථික පරිසර තත්ත්වයන් ආයෝජන අවස්ථාවන් සීමා කළද HNB ඇෂුවරන්ස් පොදු සමාගම ආයෝජන ආදායමේ සැළකිය යුතු වර්ධනයක් වාර්තා කර තිබේ. සමූහයේ ආයෝජන කළඹ මගින් පසුගිය වසරේ ආයෝජන ආදායම සමඟ සැසඳීමේදී ආකර්ෂණීය රු. බිලියන 1.7 ක ආයෝජන ආදායමක් වාර්තා කරමින් HNB ඇෂුවරන්ස් පොදු සමාගම විසින් සමූහයේ ආයෝජන ආදායම සඳහා රු. මිලියන 1,393 ක දායකත්වයක් දක්වමින් 54% ක වර්ධනයක් වාර්තා කළ අතර කළමනාකාරිත්වය යටතේ තිබෙන අරමුදල් වල 28%ක වර්ධනය එයට දායකත්වය දක්වා තිබේ. HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම සමූහයේ ආයෝජන ආදායමට රු. මිලියන 258 ක් දායක කරමින් පසුගිය වසර සමඟ සැසඳීමේදී 38% ක වර්ධනයක් දක්වා තිබේ. අපගේ යෝග්‍ය සහ දූරදර්ශී අරමුදල් කළමනාකරණ තීරණ හේතුවෙන් කොටස් වෙළෙඳපොල ආයෝජන වල කාර්යයසාධනය සියළු කොටස් මිල දර්ශකයේ කාර්යසාධනය 5.85% කින් අභිභවා යාමට හැකිවිය.

## ප්‍රාග්ධන ප්‍රමාණවත්බාවය සහ ස්ථායීතාවය (Capital Adequacy & Stability)

HNB ඇෂුවරන්ස් පොදු සමාගම විසින් 358%ක සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම විසින් 178% ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයන් (Capital Adequecy Ratio - CAR) වාර්තා කරන ලද්දේ ගිවිසුම් සහ වෙනත් වගකීම් සඳහා කළ සියලු වෙන්කිරීම් වලින් අනතුරුවයි.

## ස්තුතිය (Acknowledgments)

මා සහ සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත, සභාපති තුමිය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දක්වන ලද මගපෙන්වීම, දූරදක්නා නායකත්වය, ස්ථිරසාර සහාය වෙනුවෙන් මගේ අවංක ඇගයීම ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

එසේම අපගේ රක්ෂණ වෙළෙඳපොළහි ප්‍රමිතීන් ඉහළ දැමීමට සඳහා නිරන්තරව ලබාදෙන්නාවූ සහයෝගය සහ උත්සාහයන් වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමියට, අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ කාර්ය මණ්ඩලයට මගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි.

තවද තනිවශයෙන් හා සාමූහිකව ලබාදුන් උත්සාහය වෙනුවෙන් විධායක කමිටුවේ සියළු සාමාජිකයන්ටත් අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ටත් කාර්ය මණ්ඩලයටත් ක්ෂේත්‍ර බලකායේ සිටින සියළු සාමාජිකයන්ටත් මාගේ ස්තුතිය හිමිවේ.

අවසන් වශයෙන් අපගේ සියළුම තැරැව්කරුවන්, ප්‍රතිරක්ෂණ කරුවන්, අතරමැදි ජාලයට සහ සියළුම ක්‍රමෝපායික ව්‍යාපාර පාර්ශ්වකරුවන් ලබාදුන් නොමසුරු සහය වෙනුවෙන් මම ස්තුති කිරීමට කැමැත්තෙමි.

## අනාගත දැක්ම (Future Outlook)

නියාමන ක්ෂේත්‍රය තුළ හා සාමාන්‍ය ආර්ථික තත්වයන් තුළ සිදු වන වෙනස්කම් නිසා රක්ෂණ වෙළෙඳපොල 2018 වසරේදීත් විශේෂයෙන්ම තරඟකාරී සහ අභියෝගාත්මක වනු ඇත.අනාගතයේ තිරසාර වර්ධනය සඳහා අප සමාගම වෙළෙඳපොළ තුළ ශක්තිමත් ස්ථාවරයක සිටින අතර, පවතින ආර්ථික සහ නියාමන අභියෝගයන් අඛණ්ඩව අපගේ ව්‍යාපාර මෙහෙයුම් වලට බලපෑමක් ඇති කරන නමුත් ඒ සියල්ල අභිභවා යාමට අප හොඳින් සූදානම් වී ඇත. සමාගමේ ලාභදායිත්වය වර්ධනය කරගැනීමේ අරමුණින් නිරන්තරයෙන් වෙළෙඳපොළ පිළිබඳ දැනුම උපයෝගිකොටගෙන නිෂ්පාදන මිශ්‍රය ප්‍රශස්ථ මට්ටමකට ගෙන එන්නෙමු. තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා වන උත්සාහයන් සහ පාරිභෝගිකයන්ට නව උපකරණ සහ නව අත්දැකීම් හඳුන්වා දීම තුළ අපගේ ව්‍යාපාර ගතිකත්වයන් සම්පූර්ණ පරිවර්තනයකට භාජනය වනු ඇති බව මාගේ විශ්වාසයයි .

දීප්ති ලොකුආරච්චි
කළමනාකාර අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

2018 පෙබරවාරි 09

# HNB ඇෂුවරන්ස් PLC
## මූල්‍ය තත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට, | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **වත්කම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 169,620 | 161,362 | 119,078 | 112,151 |
| අස්පෘෂ්‍ය වත්කම් | 57,841 | 60,882 | 57,841 | 60,882 |
| විලම්භිත බදු වත්කම් | 64,098 | 52,922 | - | - |
| මූල්‍ය ආයෝජන | 15,054,910 | 11,544,575 | 12,741,015 | 9,642,596 |
| ආයෝජන - පරිපාලිත සමාගම | - | - | 1,150,000 | 1,150,000 |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය | 162,285 | 120,441 | 162,285 | 120,441 |
| ලැබිය යුතු ප්‍රති රක්ෂණ | 569,778 | 494,726 | 65,010 | 54,814 |
| ලැබිය යුතු රක්ෂණ වාරික | 786,319 | 623,294 | 7,488 | 6,805 |
| වෙනත් වත්කම් | 1,036,846 | 770,674 | 764,256 | 575,676 |
| රක්ෂණ ගිවිසුම් – විලම්භිත වියදම් | 105,287 | 74,951 | - | - |
| මුදල් සහ මුදල් සමානතා | 641,950 | 625,527 | 352,307 | 476,572 |
| **මුළු වත්කම්** | **18,648,934** | **14,529,354** | **15,419,280** | **12,199,937** |
| | | | | |
| **හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | | | | |
| **මව් සමාගමේ මුළු හිමිකරු ප්‍රාග්ධනය** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 1,171,875 | 1,171,875 | 1,171,875 | 1,171,875 |
| රඳවාගත් ඉපයීම් | 2,381,427 | 1,721,675 | 2,373,601 | 1,897,936 |
| විකිණීම සඳහා වර්ගීකරණය කරන ලද ආයෝජනයන්හි සංචිත | 30,685 | (7,152) | 17,415 | (1,465) |
| වෙනත් සංචිත | (10,760) | 1,790 | (9,884) | (1,886) |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | 223,272 | (191,131) | 223,272 | (191,131) |
| **මව් සමාගමේ මුළු හිමිකරු ප්‍රාග්ධනය** | 3,796,499 | 2,697,057 | 3,776,279 | 2,875,329 |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය** | 3,796,499 | 2,697,057 | 3,776,279 | 2,875,329 |
| | | | | |
| **වගකීම්** | | | | |
| රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත රක්ෂණ | 10,915,858 | 8,747,856 | 10,915,858 | 8,747,856 |
| රක්ෂණ ප්‍රතිපාදන - සාමාන්‍ය රක්ෂණ | 2,384,906 | 1,921,567 | - | - |
| සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | 126,083 | 90,433 | 73,875 | 50,883 |
| වර්තමාන බදු වගකීම | 34,598 | 3,300 | - | - |
| ගෙවිය යුතු ප්‍රති රක්ෂණ | 353,042 | 287,895 | 90,650 | 39,395 |
| වෙනත් වගකීම් | 896,288 | 781,246 | 529,862 | 486,474 |
| බැංකු අයිරාව | 141,660 | - | 32,756 | - |
| **මුළු වගකීම්** | 14,852,435 | 11,832,297 | 11,643,001 | 9,324,608 |
| | | | | |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | **18,648,934** | **14,529,354** | **15,419,280** | **12,199,937** |

ඉහත මූල්‍ය තත්ව ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 258 හී ඇති විගණනය කරන ලද මූල්‍ය තත්ව ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC
## ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | සමූහය | | සමාගම | | වෙනස | |
|---|---|---|---|---|---|---|
| **දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා,** | **2017** | **2016** | **2017** | **2016** | **සමූහය** | **සමාගම** |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | % | % |
| දළ ලේඛනගත රක්ෂණ වාරික | 7,821,468 | 6,656,694 | 3,963,642 | 3,554,078 | 17 | 12 |
| ප්‍රති රක්ෂකයන්ට කැපකළ වාරික | (1,100,573) | (877,713) | (189,093) | (159,050) | 25 | 19 |
| ශුද්ධ ලේඛනගත රක්ෂණ වාරික | 6,720,895 | 5,778,981 | 3,774,549 | 3,395,028 | 16 | 11 |
| නොඉපැයූ රක්ෂණ වාරිකවල සංචිතයේ ශුද්ධ වෙනස | (328,818) | (181,102) | - | - | 82 | - |
| **ඉපැයූ ශුද්ධ රක්ෂණ වාරික** | **6,392,077** | **5,597,879** | **3,774,549** | **3,395,028** | **14** | **11** |
| | | | | | | |
| **වෙනත් ආදායම්** | | | | | | |
| පොළී හා ලාභාංශ ආදායම | 1,693,191 | 1,180,085 | 1,442,073 | 987,959 | 43 | 46 |
| උපලබ්ධි වූ ශුද්ධ ලාභය/(අලාභය) | 33,128 | (29,119) | 28,789 | (22,435) | 214 | 228 |
| ශුද්ධ සාධාරණ අගය මත ලාභය/(අලාභය) | 9,704 | (6,461) | 7,653 | (7,793) | 250 | 198 |
| ගාස්තු සහ කොමිස් ආදායම් | 129,099 | 128,798 | 61,494 | 62,858 | 0.2 | (2) |
| වෙනත් ආදායම් | 46,735 | 25,019 | 24,958 | 11,017 | 87 | 127 |
| **මුළු වෙනත් ආදායම්** | **1,911,857** | **1,298,322** | **1,564,967** | **1,031,606** | **47** | **52** |
| **ශුද්ධ ආදායම** | **8,303,934** | **6,896,201** | **5,339,516** | **4,426,634** | **20** | **21** |
| | | | | | | |
| **ශුද්ධ ප්‍රතිලාභ, වන්දි සහ වියදම්** | | | | | | |
| ශුද්ධ රක්ෂණ ප්‍රතිලාභ සහ ගෙවූ වන්දි | (2,178,556) | (1,966,759) | (563,628) | (387,829) | 11 | 45 |
| ශුද්ධ ගෙවියයුතු රක්ෂණ වන්දිවල වෙනස | (114,850) | 19,114 | (11,923) | (13,848) | (701) | (14) |
| ජීවිත රක්ෂණ සංචිතයේ ගිවිසුම්ගත වගකීම්හී වෙනස | (2,166,427) | (1,708,285) | (2,166,427) | (1,708,285) | 27 | 27 |
| වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් | (1,839,018) | (1,572,964) | (1,018,770) | (886,845) | 17 | 15 |
| ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත්කරගැනීමේ වියදම් | (1,028,872) | (922,881) | (822,715) | (748,051) | 11 | 10 |
| වෙනත් රක්ෂණ අදාළ වියදම් | (49,184) | (38,905) | (30,388) | (25,134) | 26 | 21 |
| **මුළු ප්‍රතිලාභ, වන්දි සහ වියදම්** | (7,376,907) | (6,190,680) | (4,613,851) | (3,769,992) | 19 | 22 |
| | | | | | | |
| **බදු පෙර ලාභය** | 927,027 | 705,521 | 725,665 | 656,642 | 31 | 11 |
| ආදායම් බදු වියදම් | (17,275) | (58,108) | - | (56,512) | (70) | (100) |
| **වර්ෂය සඳහා වූ ලාභය** | **909,752** | **647,413** | **725,665** | **600,130** | **41** | **21** |
| | | | | | | |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | |
| **ලාභාලාභ සඳහා නැවත වර්ගීකරණය කරන ලද හෝ වර්ගීකරණය වියහැකි අයිතම** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | 489,495 | (153,476) | 461,179 | (147,913) | 419 | 412 |
| - ආදායම් ප්‍රකාශයට මාරු කරන ලද උපලබ්ධි වූ ලාභාලාභ | (30,485) | 14,466 | (27,896) | 11,614 | (311) | (340) |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | (414,403) | 134,781 | (414,403) | 134,781 | (407) | (407) |
| - ආශ්‍රිත බදු | (6,770) | 1,825 | - | - | (471) | - |
| **ලාභාලාභ සඳහා නැවත වර්ගීකරණය නොවන අයිතම** | | | | | | |
| ප්‍රතිමිනුම් මත ලාභ/(අලාභ) - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | (12,550) | 2,883 | (7,998) | 153 | (535) | (5,327) |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම (බදු පසු)** | 25,287 | 479 | 10,882 | (1,365) | 5,179 | 897 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | 935,039 | 647,892 | 736,547 | 598,765 | 44 | 23 |
| | | | | | | |
| **මුළු ලාභය :** | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු ලාභය | 909,752 | 647,413 | - | - | 41 | - |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - | - | - |
| **වර්ෂයේ මුළු ලාභය** | 909,752 | 647,413 | - | - | 41 | - |
| | | | | | | |
| **මුළු විස්තීරණ ආදායම :** | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු විස්තීරණ ආදායම | 935,039 | 647,892 | - | - | 44 | - |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - | - | - |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | 935,039 | 647,892 | - | - | 44 | - |
| | | | | | | |
| **කොටසක ඉපයීම** | | | | | | |
| කොටසක ඉපයීම - මූලික (රු.) | 18.20 | 12.95 | 14.51 | 12.00 | 41 | 21 |
| කොටසක ලාභාංශය (රු.) | - | - | 6.00 | 5.00 | - | 20 |

ඉහත ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 259 හී විගණනය කරන ලද ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමූහය

| 2017 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා, | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයීම් | අලෙවි සංචිත | වෙනත් සංචිත | ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | මුළු හිමිකම් |
|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| 2016 ජනවාරි 01 දිනට ශේෂය | 1,171,875 | 1,174,262 | (4,748) | (1,093) | (56,350) | 2,283,946 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| **- වර්ෂය සඳහා වූ ලාභය** | **-** | **647,413** | **-** | **-** | **-** | **647,413** |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (137,185) | - | - | (137,185) |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 134,781 | - | - | 134,781 |
| - ප්‍රතිමිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | 2,883 | - | 2,883 |
| වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම | - | - | (2,404) | 2,883 | - | 479 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | - | 647,413 | (2,404) | 2,883 | - | 647,892 |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | (134,781) | (134,781) |
| **හිමිකරුවන් සමඟ සිදුවූ, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | |
| **- ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | |
| - 2015 වර්ෂය සඳහා වූ ලාභාංශ ගෙවීම් | - | (100,000) | - | - | - | (100,000) |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද මුළු බෙදාහැරීම්** | **-** | **(100,000)** | **-** | **-** | **(134,781)** | **(234,781)** |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,171,875** | **1,721,675** | **(7,152)** | **1,790** | **(191,131)** | **2,697,057** |
| 2017 ජනවාරි 01 දිනට ශේෂය | 1,171,875 | 1,721,675 | (7,152) | 1,790 | (191,131) | 2,697,057 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| වර්ෂය සඳහා වූ ලාභය | **-** | **909,752** | **-** | **-** | **-** | **909,752** |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 452,240 | - | - | 452,240 |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (414,403) | - | - | (414,403) |
| - ප්‍රතිමිනුම් මත අලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | (12,550) | - | (12,550) |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | **-** | **-** | **37,837** | **(12,550)** | **-** | **25,287** |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | **-** | **909,752** | **37,837** | **(12,550)** | **-** | **935,039** |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිත අරමුදලට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 414,403 | 414,403 |
| **හිමිකරුවන් සමඟ සිදුවූ, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | |
| 2016 වර්ෂය සඳහා වූ ලාභාංශ ගෙවීම් | - | (250,000) | - | - | - | (250,000) |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද මුළු බෙදාහැරීම්** | **-** | **(250,000)** | **-** | **-** | **414,403** | **164,403** |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,171,875** | **2,381,427** | **30,685** | **(10,760)** | **223,272** | **3,796,499** |

ඉහත හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමූහය , වාර්ෂික වාර්තාවේ පිටු අංක 260 හී ඇති විගණනය කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමාගම

| 2017 දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා, | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයීම් | අලෙවි සංචිත | වෙනත් සංචිත | ජීවිත රක්‍ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | මුළු හිමිකම් |
|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| 2016 ජනවාරි 01 දිනට ශේෂය | 1,171,875 | 1,397,806 | 53 | (2,039) | (56,350) | 2,511,345 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| වර්ෂය සඳහා වු ලාභය | - | 600,130 | - | - | - | 600,130 |
| **වර්ෂය සඳහා වු වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (136,299) | - | - | (136,299) |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 134,781 | - | - | 134,781 |
| - ප්‍රතිමිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | 153 | - | 153 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | - | (1,518) | 153 | - | (1,365) |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | 600,130 | (1,518) | 153 | - | 598,765 |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිත අරමුදලට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | (134,781) | (134,781) |
| **හිමිකරුවන් සමග සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | |
| 2015 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | - | (100,000) | - | - | - | (100,000) |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද මුළු බෙදාහැරීම්** | - | (100,000) | - | - | (134,781) | (234,781) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 1,897,936 | (1,465) | (1,886) | (191,131) | 2,875,329 |
| 2017 ජනවාරි 01 දිනට ශේෂය | 1,171,875 | 1,897,936 | (1,465) | (1,886) | (191,131) | 2,875,329 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| වර්ෂය සඳහා වු ලාභය | - | 725,665 | - | - | - | 725,665 |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 433,283 | - | - | 433,283 |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (414,403) | - | - | (414,403) |
| - ප්‍රතිමිනුම් මත අලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | (7,998) | - | (7,998) |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | - | 18,880 | (7,998) | - | 10,882 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | 725,665 | 18,880 | (7,998) | - | 736,547 |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිත අරමුදලට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 414,403 | 414,403 |
| **හිමිකරුවන් සමග සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | |
| 2016 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | - | (250,000) | - | - | - | (250,000) |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද මුළු බෙදාහැරීම්** | - | (250,000) | - | - | 414,403 | 164,403 |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 2,373,601 | 17,415 | (9,884) | 223,272 | 3,776,279 |

ඉහත හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමාගම, වාර්ෂික වාර්තාවේ පිටු අංක 261 හී ඇති විගණනය කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා, | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | 2017 | 2016 | 2017 | 2016 |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| බදු පෙර ලාභය | | 927,027 | 705,521 | 725,665 | 656,642 |
| **ගැලපීම්:** | | | | | |
| පොළී ආදායම | | (1,684,689) | (1,166,369) | (1,435,151) | (976,943) |
| ලාභාංශ ආදායම | | (8,502) | (13,716) | (6,922) | (11,016) |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | 18,937 | 20,107 | 18,937 | 20,107 |
| දේපල පිරියත හා උපකරණ ක්ෂය | | 51,770 | 44,878 | 36,142 | 31,708 |
| සේවක ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් | | 30,540 | 24,142 | 18,028 | 13,984 |
| උපලබ්ධි වූ ශුද්ධ (ලාභ)/අලාභ | | (33,128) | 29,119 | (28,789) | 22,435 |
| ශුද්ධ සාධාරණ අගය මත (ලාභ)/අලාභ | | (9,704) | 6,461 | (7,653) | 7,793 |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් (ලාභ)/අලාභ | | (5,584) | 3,763 | (5,934) | 2,592 |
| | | (713,333) | (346,094) | (685,677) | (232,698) |
| මෙහෙයුම් වත්කම් වල ශුද්ධ වෙනස | (අ) | (548,793) | (787,055) | (241,501) | (130,454) |
| මෙහෙයුම් වගකීම් වල ශුද්ධ වෙනස | (ආ) | 2,796,294 | 2,447,424 | 2,262,645 | 1,806,015 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ | | 1,534,168 | 1,314,275 | 1,335,467 | 1,442,863 |
| ගෙවූ පාරිතෝෂිකය | | (7,440) | (11,827) | (3,397) | (8,156) |
| ආර්ථික සේවා ගාස්තු | | (16,919) | (10,250) | - | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | | 1,509,809 | 1,292,198 | 1,332,070 | 1,434,707 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ආයෝජන සුරැකුම් ශුද්ධ මිලදී ගැනුම් | | (2,767,527) | (1,937,075) | (2,425,152) | (1,920,005) |
| ලද පොළී | | 1,443,722 | 1,079,377 | 1,231,609 | 880,938 |
| ලද ලාභාංශ | | 9,100 | 13,625 | 7,483 | 10,858 |
| අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනුම් | | (15,896) | (35,804) | (15,896) | (35,804) |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනුම් | | (64,943) | (75,393) | (46,196) | (53,895) |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් සඳහා ලද මුදල් | | 10,498 | 1,670 | 9,061 | 1,551 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යොදා ගත් ශුද්ධ මුදල් ප්‍රවාහ | | (1,385,046) | (953,600) | (1,239,091) | (1,116,357) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ලාභාංශ ගෙවීම් | | (250,000) | (100,000) | (250,000) | (100,000) |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදා ගත් ශුද්ධ මුදල් ප්‍රවාහ | | (250,000) | (100,000) | (250,000) | (100,000) |
| **මුදල් සහ මුදල් වලට සමාන වත්කම් වල ශුද්ධ (අඩුවීම)/වැඩිවීම** | | (125,237) | 238,598 | (157,021) | 218,350 |
| වසර මුල මුදල් සහ මුදල් වලට සමාන වත්කම් | | 625,527 | 386,929 | 476,572 | 258,222 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් වලට සමාන වත්කම්** | | 500,290 | 625,527 | 319,551 | 476,572 |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ සටහන්** | | | | | |
| **(අ) මෙහෙයුම් වත්කම් වල වෙනස** | | | | | |
| විලම්භිත වියදම් වල වැඩි වීම් | | (30,336) | (9,016) | - | - |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය වල වැඩි වීම් | | (41,844) | (27,949) | (41,844) | (27,949) |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වල වැඩිවීම් | | (75,052) | (353,372) | (10,196) | (20,545) |
| ලැබිය යුතු රක්ෂණ වාරිකයන්හී වැඩිවීම් | | (163,025) | (277,378) | (683) | (1,213) |
| මුළු වෙනත් වත්කම් වල වැඩිවීම් | | (238,536) | (119,340) | (188,778) | (80,747) |
| **මෙහෙයුම් වත්කම් වල ශුද්ධ වෙනස** | | (548,793) | (787,055) | (241,501) | (130,454) |
| **(ආ) මෙහෙයුම් වගකීම් වල වෙනස** | | | | | |
| අනෙකුත් වගකීම් වල වැඩි වීම් | | 99,806 | 175,356 | 43,388 | 63,391 |
| රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත රක්ෂණ වල වැඩි වීම් | | 2,168,002 | 1,740,776 | 2,168,002 | 1,740,776 |
| රක්ෂණ ප්‍රතිපාදන - සාමාන්‍ය රක්ෂණ වල වැඩි වීම් | | 463,339 | 375,302 | - | - |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ - වැඩි වීම් | | 65,147 | 155,990 | 51,255 | 1,848 |
| **මෙහෙයුම් වගකීම් වල ශුද්ධ වෙනස** | | 2,796,294 | 2,447,424 | 2,262,645 | 1,806,015 |

ඉහත මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 262 හී ඇති විගණනය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.